# වාරණ வாரணம்

"වාරණ/වාරණම්" ද්විභාෂිකව (සිංහල හා දමිළ) ශ්‍රී ලංකාවේ පළවන ප්‍රථම සොබාදහම පිළිබඳ සඟරාව

“வாரன/வாரணம்” இலங்கையில் முதன் முதலில் இரு மொழிகளில் (சிங்களம் மற்றும் தமிழ்) வெளியிடப்படும் இயற்கைசார் சஞ்சிகை

“Warana/Varanam” the First Bilingual (Sinhala and Tamil) Magazine on Nature to be publish in Sri Lanka

11 වෙළුම 2 සහ 3 කළාපය මැයි සහ දෙසැම්බර් 2019 | இதழ். 11 இலக்கம் 2,3 இருக்கலாம், மார்கழி 2019 | Vol. 11 No. 2 & 3 May & December 2019



ශ්‍රී ලංකා වනසත්ව හා ස්වභාව ආරක්ෂක සංගමයේ ප්‍රකාශනයකි

இலங்கை வனவிலங்கு மற்றும் இயற்கைப் பாதுகாப்புச் சங்கத்தின் வெளியீடு

A Publication of the Wildlife & Nature Protection Society (WNPS) of Sri Lanka

ISSN 2235-9850

www.wnpssl.org www.facebook.com/wnpssl twitter.com/wnpssl

# සත්ත්ව නාමකරණය හා වනජීවී සංරක්ෂණය

**ඒ. ඒ. තසුන් අමරසිංහ**




**Figure 1:** ජෛව වර්ගීකරණයේදී ලෝකයේ සිටින සියළුම ජීවීන් මුලින්ම ප්‍රධාන කොටස් 7 කට වර්ගීකරණය කරනවා. ඒ එක් කොටසකට කියනවා රාජධානියක් (Kingdom) කියලා. මේ රාජධානියත් ආපහු වර්ගීකරණය කරනවා විවිධ වංශ (Phyla) වලට. ඊට පස්සෙ පංති (Classes) වලට, ගෝත්‍ර (Orders) වලට, කුල (Families) වලට. තව දුරටත් බෙදනවා ගණයන් (Genera) වලට. ඔය එක ගණයක් යටතෙ අඩුම තරමෙ එක විශේෂයක් හරි නැත්නම් විශේෂ සිය දහස් ගණනක් උනත් ඉන්න පුළුවන්.
© photo: www.byjus.com

අපි මේ සාකච්ඡාව කාලීන මාතෘකාවකින්ම පටන් ගනිමු. පහුගිය දිනවල හැමතැනම කතාවෙන මාතෘකාවක් තමා 5/2001 චක්‍රලේඛය ඉවත් කිරීම මඟින් 'රක්ෂිත නොවන' රජයේ වනාන්තර අනාරක්ෂිත වීම. ලංකාවේ 'රක්ෂිත' විදියට නීතිමය වශයෙන් ආරක්ෂා නොකෙරෙන එහෙත් වටිනා ප්‍රාථමික වනාන්තර රැසක් රජයට අයත් වෙනවා. දැන් අපි හිතමු ආණ්ඩුවෙන් හෝ පෞද්ගලික අංශයෙන් මේ වගේ 'රක්ෂිත නොවන' වනාන්තරයක් කපලා යම්කිසි සංවර්ධන ව්‍යාපෘතියකට යොදාගන්න යෝජනාවක් ගෙනාවා කියල. එතකොටම ඒ වනාන්තරය ආරක්ෂා කරගන්න පරිසර ක්‍රියාකාරීන් සහ විවිධ පරිසර ලෝලීන් පෙළගැහෙනවා ඒ යෝජනාවට විරුද්ධව. ඒත් ඉතිං සමාජය තුල විරෝධතා සංවිධානය කිරීමෙන්ම පමණක් ඒ වනාන්තරය රැක ගන්න පුළුවන්ද? බැහැ. ඇයි? මොකද ඒකට තියෙන්න ඕනේ විද්‍යාත්මක පදනමක්. ඒ කියන්නෙ එම වනාන්තරය කොච්චර වැදගත්ද කියල ආණ්ඩුවට ඒත්තු ගන්වන්න ඕනේ. බැරිම උනොත් අධිකරණයට හෝ කරුණු ඉදිරිපත් කරල නියෝගයක් ලබාගන්න ඕනේ. ජෛව විවිධත්වය අතින් ඉහල වනාන්තරයක් වීම, ජල පෝෂක ප්‍රදේශයක් වීම, සංවහන වැසි සඳහා සෘජුව බලපෑම... ආදී මිනිසාගේ පැවැත්මට වැදගත් බව පෙන්වීම තමා සරලම ක්‍රමය. "ආහ්... ඒ කැලේ මුවෝ, හාවො, කටුස්සො, සර්පයො, කුරුල්ලො ඉන්නවා... ඒ නිසා විනාශ කරන්න එපා!" කියල කිව්වට හරියන්නෙ නෑ. එහෙම බැලුවොත් ඉතිං කුරුල්ලො, සර්පයො, හූනො, කටුස්සො අපේ ගෙවතු වලත් ඉන්නවනෙ. ඒ වෙනුවට විද්‍යාත්මකව සමීක්ෂණයක් කරල ඒ වනාන්තරයේ ඉන්න ජීව විශේෂයන්ගේ විද්‍යාත්මක නාමයන් සහිත ලැයිස්තුවක් ඉදිරිපත් කරන්න ඕනේ. ඒ ලැයිස්තුවේ ලංකාවට ආවේණික හෝ තර්ජනයට ලක්වුණු ජීව විශේෂ ඉන්නව නම් ඒ වනාන්තරය ආරක්ෂා කර ගැනීම ගොඩාක් පහසු වෙනවා. පරිසර විද්‍යාඥයන්ගේ පර්යේෂණ මඟින් අපේ වනාන්තර වල ඉන්න ජීව විශේෂ ඒ ඒ වනාන්තරයට ආවේණික වෙන තරමට, විවිධත්වය වැඩි බව පෙන්වන තරමට, පරිසර ක්‍රියාකාරීන්ට ඒ වනාන්තර ආරක්ෂා කරගැනීමට මැදිහත් වීමේ හැකියාව පහසු වෙනවා. උදාහරණයක් විදියට එම වනාන්තරයෙ තියෙන ජෛව විවිධත්වය සම්බන්ධව විද්‍යාත්මක ලිපි රැසක් දැනටමත් ප්‍රකාශයට පත්වෙලා තියෙනව නම් එම ප්‍රදේශයේ සංවර්ධන ක්‍රියාවලියක් සිදු කිරීමට ඉතාමත් අපහසුයි. මොකද අඩුම තරමෙ පාරිසරික බලපෑම් තක්සේරු වාර්තා සැකසීමේදීවත් එවැනි විද්‍යාත්මක ලිපි අනිවාර්යෙන්ම එම වාර්තාවේදී විශ්ලේෂණය වෙලා තිබිය යුතුයි.

එවැනි තක්සේරු වාර්තා (Assesments & Reports), විද්‍යාත්මක ලිපි (Research Articles) වගේම තර්ජනයට ලක් වූ ජීව විශේෂ ලැයිස්තු (උදා. IUCN Red List) සියල්ලම පල කරන්නෙ පරිසර විද්‍යාඥයන් සහ පර්යේෂකයන් විසින්. ඉතිං මේ විද්‍යාත්මක දත්තයන් තමයි ඊළඟට පරිසර ක්‍රියාකාරීන්, ජනමාධ්‍යවේදීන්, නීතිවේදීන් වගේම විවිධ රජයේ ආයතන (උදා. මධ්‍යයම පරිසර අධිකාරිය) මඟින් භාවිතා කරල, මේ විනාශ කරන්න යන වනාන්තරය හෝ පරිසර පද්ධතිය ආරක්ෂා කරගන්න ක්‍රියාකාරීව මැදිහත් වෙන්නෙ. ඒ නිසා සමස්ථ පරිසර සංරක්ෂණ ක්‍රියාවලියම රඳාපවතින්නෙ පාරිසරික පර්යේෂණ වල ප්‍රතිඵල මත.

ඉතිං ඔය කියන මොන පර්යේෂණය සිදු කරන්නත් මූලික පියවර විදියට ජීව විශේෂ එක් එක් නම් වශයෙන් හඳුනාගැනීම ඉතාමත් වැදගත්. ඉහත උදාහරණයටම අදාලව අපි ඔය කියන වනාන්තරයෙ ඉන්න ජීව විශේෂ නිවැරදිව හඳුනා නොගත්තොත් වෙන්නෙ මොකක්ද? උදාහරණයක් විදියට අපි හිතමු ඔන්න කවුරු හරි කියනව මේ කැලයේ හෝතම්බුවො, පලා පොළොංගු, කෑදැත්තො, සහ දිය පාරවල පෙතියො ඉන්නව කියල. එහෙම විතරක් කිව්වොත් ඔය සත්තු ඔය විදියටම මුළු ආසියාවෙම ඉන්නවා. ඒ ගැන කාගෙවත් අවධානයක් යොමු වෙන්නෙත් නෑ. නමුත් කවුරුහරි කිව්වොත් මේ කැලයේ *Paradoxurus zeylonensis, Trimeresurus trigonocephalus, Ocyceros gingalensis* සහ දිය පාරවල *Puntius bandula* ඉන්නව කියල, ඒ වනාන්තරය සුවිශේෂී වනාන්තරයක් විදියට පිළිගැනෙනවා විතරක් නෙමෙයි, පරිසර ක්‍රියාකාරීන්ට එම වනාන්තර කොටස රක්ෂිතයක් බවට පත් කිරීම සඳහා ආණ්ඩුවට අවශ්‍ය බලපෑම් කිරීමටත් විද්‍යාත්මක පසුබිමක් සැලසෙනවා. මොකද ඔය ඉහත විද්‍යාත්මක නම් වලින් හඳුන්වල තියෙන ජීවීන් ඉන්නෙ මුළු ලෝකෙන්ම ලංකාවෙ විතරයි, ඒ කියන්නෙ ලංකාවට ආවේණිකයි. දැන් ඔයගොල්ලන්ට පැහැදිලි වෙනව ඇති ජීව විශේෂයක් නිවැරදිව හඳුනාගැනීමෙන් පසු නිවැරදි විද්‍යාත්මක නාමයක් භාවිතා කිරීම තුලින් කොතරම් බලපෑමක් සිදු වෙනවද කියල. ඒ වගේම විද්‍යාත්මක නාමකරණය පරිසර සංරක්ෂණයට කෙතරම් වැදගත් වෙනවද කියල. සරලවම කිව්වොත් ජෛව විවිධත්ව සංරක්ෂණයේ මූලිකම පියවර සත්ත්ව සහ ශාක නාමකරණයයි.

ලෝකයේ ඕනෑම දෙයක් වර්ගීකරණය කරන්න පුළුවන් විවිධ ක්‍රම තියෙනවා. පෙනුම අනුව, ක්‍රියාකාරිත්වය අනුව, භාවිතා කරන ක්‍රමය අනුව...

ආදී වශයෙන් දහස්ගණනක් හේතු තියෙනවා විවිධ දේවල් වර්ගීකරණය කරන්න. ඒත් අපි දැන් බලමු සත්ත්ව විද්‍යාව තුල විද්‍යාත්මකව වර්ගීකරණය කරන්නෙ කොහොමද කියල. ඒක සිද්ධ වෙන්නෙ මූලික වශයෙන්ම බාහිර ස්වරූපය (Morphology) අනුව. ඊට අමතරව පරිණාමීය සම්බන්ධතා (Evolution), ජෛව-භූගෝලීය සාධක (Biogeography), වගේම හැසිරීම් (Behaviours), අනුවර්තන (Adaptations), සහ දේහ අභ්‍යන්තර ලක්ෂණ (Anatomy) පවා සලකා බලනවා.

ජෛව වර්ගීකරණයේදී ඉහත ලක්ෂණ අනුව ලෝකයේ සිටින සියළුම ජීවීන් මුලින්ම ප්‍රධාන කොටස් 7 කට වර්ගීකරණය කරනවා. ඒ එක් කොටසකට කියනවා රාජධානියක් (Kingdom) කියල. එයින් උදාහරණ කීපයක් සැලකුවොත් බැක්ටීරියා රාජධානිය, ශාක රාජධානිය, දිලීර රාජධානිය, සත්ත්ව රාජධානිය. මේකෙන් සත්ත්ව රාජධානිය (Kingdom Animalia) සැලකුවොත් ඒකට අයිති වෙන්නෙ සියළුම සතුන්. ඒ කියන්නෙ මුහුදු ස්පොන්ජියාවන්, ජෙලිෆිෂ්, පැතැල්ලන්, පණුවන්, ගොළු බෙල්ලන්, කෘමිසතුන්ගේ ඉඳල මාළු, ගෙම්බො, උරගයො, කුරුල්ලො, සහ විශාලම ක්ෂීරපායි සතා වෙන නිල් තල්මහ දක්වා සියළුම සත්තු අයිති වෙන්නෙ මෙන්න මේ සත්ත්ව රාජධානියට. මේ සත්ත්ව රාජධානියත් ආපහු වර්ගීකරණය කරනවා විවිධ වංශ (Phyla) වලට. උදාහරණයක් විදියට කොඳු ඇට පෙළක් තියෙන මාළු, ගෙම්බො, උරගයො, කුරුල්ලො, ක්ෂීරපායින් අයත් වෙන්නෙ පෘෂ්ඨ-වංශයට (Phylum Chordata). ඊට පස්සෙ මේ වංශයත් තව දුරටත් වර්ගීකරණය කරනවා විවිධ පංති (Classes) වලට. උදාහරණ විදියට උරගයින් අයිති වෙන්නෙ උරග පංතියට (Class Reptilia). ඊට පස්සෙ මේ පංතියත් ආපහු වර්ගීකරණය කරනවා ගෝත්‍ර (Orders) වලට. උදාහරණයක් විදියට හූනො, කටුස්සො, තලගෙ ායි වගේ කකුල් තියෙන චතුර් පාදික උරගයො අයිති වෙන්නෙ කටසු ගෝත්‍රයට (Order Sauria). මේ ගෝත්‍රයත් තව දුරටත් වර්ගීකරණය කරනවා කුල (Families) වලට. උදාහරණයක් විදියට ගෙවතු කටුස්සො, අං කටුස්සො, පිනුම් කටුස්සො අයිති වෙන්නෙ බොහොඩ කුලයට (Family Agamidae). ඊට පස්සෙ මේ කුලයත් බෙදනවා තව දුරටත් ගණයන් (Genera) වලට. උදාහරණයක් විදියට ගෙවතු කටුස්සො අයිති වෙන්නෙ ගෙවතු-කටුසු ගණයට (*Genus Calotes*). ඔය එක ගණයක් යටතේ අඩුම තරමෙ එක විශේෂයක් හරි නැත්නම් විශේෂ සිය දහස් ගණනක් උනත් ඉන්න පුළුවන්. උදාහරණයක් විදියට ලංකාවෙ Calotes කියන ගණය යටතෙ විශේෂ කීපයක්ම ඉන්නවා. ගෙවතු වල ඉන්න පලා-කටුස්සා (*Calotes calotes*) සහ ගරා-කටුස්සා (*Calotes versicolor*) එයින් උදාහරණ දෙකක්.

ඉතිං ඔය විදියට ලෝකයේ ඉන්න සෑම විශේෂයක්ම ඉහලින් පැහැදිලි කරපු විදියට නිවැරදි තැනකට වර්ගීකරණය කරනවා. එතකොට සමාන ලක්ෂණ තියෙන විශේෂ එක තැනක කිට්ටුවෙන් කිට්ටුව ඉන්නවා. එතකොට අධ්‍යයනය කරන්න හරිම පහසුයි. ඒ විදියට ඕනෑම විශේෂයක් නියමිත ගැලපෙන තැනට වර්ගීකරණය කලාට පස්සෙ ඒ අනුව එම විශේෂය නාමකරණය කරනවා. සරලව කිව්වොත් විද්‍යාත්මක නමක් ලබා දෙනවා.

වර්ගීකරණය වගේම නාමකරණයත් ආරම්භ වුනේ මිනිසාගේ සම්භවයත් එක්කම තමා. ආදී මානවයා විවිධ දේවල් වෙන් කර හඳුනාගෙන ඒ පිළිබඳව එකිනෙකා අතර සංඥා මාර්ගයෙන් සන්නිවේදනය කරගන්න පටන්ගත්තු දවසෙම නාමකරණයත් ආරම්භ වුනා. ආදී මානවයා හස්ත සංඥා වගේම විවිධ සරල රේඛා ඇඳීම මඟින් නාමකරණය කළා. දඩයමේ යනකොට දඩයම් කල හැකි සතුන් වෙන් කරගෙන කණ්ඩායම අතර සන්නිවේදනය කිරීමට විවිධ සංඥා නාමත්, ඒ වගේම අනතුරුදායක සතුන් හමුවූ විට වෙනත් සංඥා නාමත් යොදාගැනීම නාමකරණයේ ආරම්භක අවස්ථාවන් විදියට සලකන්න පුළුවන්. පසු කාලීනව භාෂාව දියුණු වීමත් එක්ක විවිධ නම් භාවිතා කරන්න පටං ගත්තා. එම නම් එදිනෙදා හමුවන ජීව විශේෂ වෙන් කර හඳුනාගැනීමටත් පටන් ගැනුනා. එම නිසා එකම ජීවී කාණ්ඩයකට විවිධ ප්‍රදේශ වල, විවිධ භාෂා වලින් විවිධ නම් වලින් වචන ගොඩක් නිර්මාණය වුනා. උදාහරණ විදියට ලංකාවෙදි "අලියා"ට පාලි (සහ මැලේ) භාෂාවෙන් "ගජ" විදියටත්, දමිළ භාෂාවෙන් "යානෙයි" විදියට භාවිතා වෙනකොට, ඉන්දියාවෙ සංස්කෘත භාෂාවෙන් "හස්ථි" හා හිංදි භාෂාවෙන් "හතී" ලෙස භාවිතා උනා. නමුත් තායිලන්තයේ, අප්‍රිකාවෙ භාවිත කරන්නෙ වෙනත් නම්. මේ නිසා පසු කාලයකදී, එකම විශේෂයකට විවිධ නම් තිබීමත්, ඒ වගේම එකම නමකින් විවිධ විශේෂ හැඳින්වීමත් නිසා සත්ත්ව විශේෂ හඳුනාග ැනීමේ හා සන්නිවේදනයේ ගැටළු මතුවෙන්න පටන් ගත්තා.

උදාහරණයක් විදියට මෙහෙම හිතමු. පර්වතයක් වැනි පෙනුමක් තියෙන, ලොකු කන් දෙකක් තියෙන, දිග බටයක් වැනි නාසයක් තියෙන, උල් වූ දිග දත් දෙකක් තියෙන සත්තු (අපි කියන්නෙ




**Figure 2:** විද්‍යාත්මක වර්ගීකරණය හා නාමකරණය පිළිබඳ සුබෙදු විද්‍යාව (*Taxonomy*) ලොවට හඳුන්වාදීමත් සමඟම බාහිර රූපාකාරය සලකා බලලා, ලෝකයේ දැනට අලින්ගේ උපවිශේෂ හයක් ඉන්න බව සොයාගත්තා. ලංකාවේ ඉන්න උප විශේෂය, *Elephas maximus maximus* ලෙසත් නාමකරණය කලා. වර්තමානයේ අලි සංරක්ෂණයේ සියළුම ක්‍රියාකාරකම් වල මූලිකම පියවර වුනේ අලින්ව විද්‍යාත්මක නාමකරණට බඳුන් කිරීමයි. එසේ නොවුනා නම් අලියා කියන සතා ලෝකයේ පුළුල්ව ව්‍යාප්ත වූ සතෙක් විදියටත්, සංරක්ෂණය සඳහා කිසිඳු වැදගත්කමක් නැති සතෙක් විදියටත් සැලකෙනවා නොඅනුමානයි!
© photo: www.byjus.com

# සත්ත්ව නාමකරණය හා වනජීවී සංරක්ෂණය

අලියා) ආසියාවෙ වගේම අප්‍රිකාවෙත් පැතිරිලා ඉන්නවා. එක එක ප්‍රදේශ වල අය එක එක නම් වලින් වගේම විවිධ භාෂා වලින් විවිධ නම් වලින් මේ සතාව හඳුන්වනවා. හදිස්සියේවත් විද්‍යාත්මක නාමකරණයක් නොතිබුණා නම් ලංකාවෙ සිටින අලියා තර්ජනයට ලක්වූ උප විශේෂයක් බව කවුරුවත් දන්නෙ නෑ! ඒ වගේම ඒ සත්ත්වයා ආරක්ෂා කල යුතු තර්ජනයට ලක්වූ විශේෂයක් කියල කවුරුවත් ආරක්ෂා කරන්න උනන්දු වෙන්නෙත් නෑ. හරියටම ගැරඬියා වගේ. ගැරඬියාව ආරක්ෂා කරගන්න කවුරුවත් අලියා තරම් වෙහෙසෙන්නෙ නැත්තෙ ඇයි? එකම ගැරඬි විශේෂය ලෝකයේ විවිධ රට වල පුළුල්ව පැතුරුණු ව්‍යාප්තියක් තියෙන නිසා. අපිත් අලියව විද්‍යාත්මක නාමකරණය නොකර ඔය වගේ පර්වතයක් වැනි පෙනුමක් තියෙන සතෙක් විදියට විතරක් සැලකුව නම් අලිය ගැරඬියාටත් වඩා ලෝකයේ වැඩි වශයෙන් ව්‍යාප්ත වෙලා ඉන්න සතෙක් බවට පත් වෙනවා. ඒත් විද්‍යාත්මක වර්ගීකරණය හා නාමකරණය පිළිබඳ සුබෙදු විද්‍යාව (Taxonomy) ලොවට හඳුන්වාදීමත් සමගම, ඔවුන්ගේ බාහිර රූපාකාරය සලකලා බලලා, ලෝකයේ දැනට අලින්ගේ උපවිශේෂ හයක් ඉන්න බව සොයාගැනුනා.

ලංකාවේ ඉන්න උප විශේෂය, *Elephas maximus maximus* ලෙසත් නාමකරණය කලා. වර්තමානයේ අලි සංරක්ෂණයේ සියළුම ක්‍රියාකාරකම් වල මූලිකම පියවර වුනේ ලෝකයේ සිටින සියළුම අලි ගහනයන් හඳුනාගෙන, විද්‍යාත්මකව වර්ගීකරණය කරලා, විද්‍යාත්මක නාමකරණට බඳුන් කිරීමයි. එසේ නොවුනා නම් අලියා කියන සතා ලෝකයේ පුළුල්ව ව්‍යාප්ත වූ සතෙක් විදියටත්, සංරක්ෂණය සඳහා කිසිඳු වැදගත්කමක් නැති සතෙක් විදියටත් සැලකෙනවා නොඅනුමානයි.

ඉතිං ඉහතින් සඳහන් කල ගැටළු මඟහරවා ගෙන විද්‍යාත්මකව සත්ත්ව නාමකරණය ලොවට හඳුන්වල දුන්නෙ ස්වීඩන් ජාතික ජීව විද්‍යාඥයෙක් වෙච්ච කැරෝලස් ලීනියස් (Carolus Linnaeus) කියන විද්‍යාඥයා. 1758 දී ඔහු අපූරු ක්‍රමයක් හඳුන්වලා දුන්නා. ඒ ක්‍රමේට කියන්නෙ ද්විපද නාමකරණය (binomial nomenclature) කියල. සරලවම කිව්වොත් ඕනෙම සතෙකුට පද දෙකක් සහිත නමක් ලබා දෙන ක්‍රමයක්. හරියට මිනිස්සුන්ට තියෙන මුල් නමයි, වාසග මයි සහිත නම් දෙකක් වගේ. හැබැයි මිනිස්සු එක්නෙකාට නම් තිබුණට සත්ත්ව විද්‍යාවෙදි නම් දෙන්නෙ විශේෂයෙන් විශේෂයට. හරි අපි සරල උදාහරණයක් ගනිමු. මගේ නම තසුන් අමරසිංහ. මගේ නමේ පද දෙකක් තියෙනවා. මුල් නම "තසුන්", අනෙක් නම "අමරසිංහ". මගේ මල්ලිගෙ නම "දිනෙත් අමරසිංහ". ඒ නමෙත් පද දෙකයි, මුල් නම "දිනෙත්", දෙවනි නම "අමරසිංහ" හැබැයි නම් දෙකේම "අමරසිංහ" කියල පොදු නමක් තියෙනවා. ඇයි? ඒක තමා වාසගම. ලිනේයස් කියන ක්‍රමෙත් ඒ වගේම එකක්. ජීව විශේෂයකට ලබා දෙන නමෙත් පද දෙකක් තියෙන්න ඕනෙ. හැබැයි පොදු නම (වාසගම) ලියන්නෙ මුලින්, ඊට පස්සෙ තමා මුල් නම ලියන්නෙ. වාසගමට කියන්නෙ "ගණ නාමය" කියල. මුල් නමට කියන්නෙ "විශේෂ නාමය" කියල. එතකොට එකම ගණ නාමය තියෙන විශේෂ ගොඩක් ඉන්න පුළුවන්. ඒ එකම ගණයක් යටතේ හම්බ වෙන්නෙ එකිනෙකට කිට්ටු සම්බන්ධතා තියෙන, බාහිර රූපාකාරයෙනුත් යම් යම් සමානකම් තියෙන විශේෂ. හරියට එක පවුලෙ සහෝදර සහෝදරියො වගේ සමානකම් තියෙනවා. ඒ වගේම එකිනෙකාට වෙනස්. මේ නාමකරණ ක්‍රමය ලෝකයම පිළිඅරගෙන අද වෙනකොට ලෝකයේ ඕනෑම ජීව විශේෂයක් නාමකරණය කරන්නෙ මේ ක්‍රමයට. කිසිම කෙනෙකුට මේ නීතියට පිටින් ජීව විශේෂයක් නම් කරන්න බෑ! මේ නීතිය සහ වෙනත් නීති සිය ගණනක් ඇතුලත් කරපු ලොකු නාමකරණ නීති සංග්‍රහයක් තියෙනවා International Code of Zoological Nomenclature (ICZN) කියල. ඒක මුළු ලෝකයම පිළිගත් සම්මුතියක්.



**Figure 3:** විද්‍යාත්මක සත්ත්ව නාමකරණය ලොවට හඳුන්වල දුන්නෙ ස්වීඩන් ජාතික ජීව විද්‍යාඥයෙක් වෙච්ච කැරෝලස් ලීනියස් (Carolus Linnaeus) කියන පුද්ගලයා. 1758 දී ඔහු අපූරු ක්‍රමයක් හඳුන්වලා දුන්නා. ඒ ක්‍රමේට කියන්නෙ ද්විපද නාමකරණය (binomial nomenclature) කියලා. © Photo: www.sciencephoto.com




**Figure 4:** නාමකරණ නීති සිය ගණනක් ඇතුලත් කරපු ලොකු නීති සංග්‍රහයක් තියෙනවා International Code of Zoological Nomenclature (ICZN) කියල. ඒක මුළු ලෝකයම පිළිගත් සම්මුතියක්.
© Photo: www.amazon.com

මේ නාමකරණ නීතිරීති වලට එකඟව සත්ත්ව විශේෂ නාමකරණය කිරීම ලෙහෙසි පහසු කාර්යයක් නෙමෙයි. ඒක වෙනම විද්‍යාවක් වගේම වෙනම කලාවක්. ඒ සඳහා ලෝකයේ ඒ පිළබඳව විශේෂඥතාවය ලබාගත්තු සුබෙදු විද්‍යාඥයන් (Taxonomists) ඉන්නවා. ඒගොල්ලන්ගෙ කාර්යභාරය ගැනත්, ඔය විදියට සත්ත්ව විශේෂයක් නම් කරන විද්‍යාවේ මූලික සිද්ධාන්ත ගැනත් ඊළඟ කොටසේදි සාකච්ඡා කරමු.